නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත "බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්" යන පාඨය පහළ වන තෙක් සූරාව වෙන්කර හඳුනා ගත නොහැකි විය

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත "බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්" යන පාඨය පහළ වන තෙක් සූරාව වෙන්කර හඳුනා ගත නොහැකි විය." [صحيح] [رواه أبو داود]

සැබැවින්ම අල් කුර්ආනයේ සූරාවන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පහළ වෙමින් පැවතිණි. නමුත් එහි වෙන් කිරීම හා එහි අවසානය එතුමාණන් වෙත "බිස්මිල්ලාහි-ර් රහ්මානි-ර් රහීම්" යන පාඨය පහළ වන තෙක් දැන ගත්තේ නැත. පසුව පෙර සූරාව අවසන් වී නව සූරාවක් ආරම්භ වී ඇතැයි එතුමාණන් දැන ගනී.

https://sunnah.global/hadeeth/si/show/65051